ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මැයි 12 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 31 දින සභාවේ ලේකම්ට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
---------------------------

පහත ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පළාත් පාලන සේවා නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ වශයෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ඉකුත් වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු රු. 694,814 ක් සඳහා විශ්රාම වැටුප් වෙන්කිරීම් කර නොතිබුණි. මේ හේතුවෙන් සමුච්චිත අරමුදල් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) වර්ග 4 ක ගොඩනැගිලි වටිනාකම වූ රු. 3,835,000 ක් ගිණුම්ගත කර නොතිබූ බැවින්, මූල්‍ය ප්‍රකාශනවල ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාවූ කාල පරිච්ඡේදයට අයත් මුද්දර ගාස්තු රු. 430,850 ක් ගිණුම්ගත කර නොතිබුණි.

1.3.3 ලේඛන හා පොත්පත් නොපැවැත්වීම
----------------------------------------------

සභාව විසින් ඉඩම් ගොඩනැගිලි ලේඛනය, ස්ථාවර වත්කම් ලේඛනය, හානි පාඩු ලේඛනය හා මිණුම් ලේඛනය යනාදි ලේඛන පවත්වා නොතිබුණි.

1.3.4 ලැබියයුතු ගිණුම්
--------------------

1999 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අයත් රු. 156,215 ක අත්තිකාරම් 02 ක් මෙතෙක් සභාව විසින් නිරවුල් කර ගෙන නොතිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

භාණ්ඩ ලැබීම් පත්‍ර නොමැති වීම නිසා රු. 85,055 ක් වටිනා ගනුදෙනු 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණ කිරීමට නොහැකිවී තිබුණි.

1.3.6 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන රීති) පරිච්ඡේදයේ III රීති 32 | සභාව විසින් වරිපනම් බදු තක්සේරු කිරීම සම්බන්ධයෙන් තක්සේරු ලේඛන පවත්වා නොතිබුණු අතර වරිපනම් අයකිරීම් සභාව විසින් සිදුකර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | |
| (i) මුදල් රෙගුලාසි 315 | ගණන්දීමේ නිලධාරියා විසින් රජයේ වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සඳහා ආරක්ෂක වැඩ පිළිවෙලක් ගත්බව තහවුරු වී නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 316(2) | දෛනික මුදල් ශේෂය පිළිබඳ සුරක්ෂිතාගාර භාණ්ඩ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 571 | කල් ඉකුත්වූ තැන්පත් රු. 1,373,254 ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 880 | මුදල් සහ ගබඩා භාරව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප ලබාගත් බව සනාථ කර නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 1645 | දෛනික ධාවන සටහන් මාසිකව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 1990 ඔක්තෝබර් 10 වන දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛය | සභාව සතු වාහනවලට ඉන්ධන පාරිභෝජනය පිළිබඳ පරීක්ෂණ පවත්වා නොතිබුණි. |

1.3.7 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පරවි කුඩුවක් වර්ණවත් කිරීමට සහ ආරක්ෂා කිරීමට රු. 1,292,854 ක් වටිනාකමට 2015 වර්ෂයේදී ඇස්තමේන්තුවක් සකස්කර වැඩ ආරම්භකර තිබුණද, එම වැඩ මෙතෙක් අවසන් කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 2,252,348 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම් ඉක්මවූ ආදායම රු. 751,422 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 1,500,926 කින් වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය ශුද්ධ අතිරික්තය රු. 2,119,384 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු. 357,582 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 1,761,802 කින් වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 6,129,907 ක් වි තිබූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 3,372,923 ක් වී තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනයේ රු. 2,756,984 කින් වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.4 ආදායම් පරිපාලනය

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

ලේකම් විසින් ඉදිරිපත් කර තිබූ පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2016<br>ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 103 | 96 | 7 |
| බදු කුලී | 1,028 | 855 | 78 |
| බලපත්‍ර ගාස්තු | 22 | 77 | - |
| වෙනත් ආදායම් | 17,442 | 12,418 | 2,683 |
| එකතුව | 18,595 | 13,446 | 2,768 |

2.4.2 වරිපනම් බදු

--------------

සභාවේ දේපළ සඳහා වරිපනම් බදු අයකර නොතිබුණි.

2.4.3 බදු හා කුලි

--------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 43,700 ක බදු සභාව විසින් අයකර නොතිබුණි.

(ආ) ගල්රෝල බදු දීමෙන් රු. 775,000 හිඟ කුලි අයවීමට තිබුණි.

2.4.4 බලපත්‍ර ගාස්තු

----------------

සභා බලප්‍රදේශයේ ඉදිකර තිබූ සන්නිවේදන කුළුනු 01 කින් වාර්ෂික බදු අයකර නොතිබුණි.

2.4.5 වෙනත් ආදායම්

-----------------

සභා බලප්‍රදේශයේ තිබෙන සුසාන භූමි 06 කින් බදු අයකර නොතිබුණි.

2.4.6 මුද්දර ගාස්තු

---------------

2006 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාවූ කාල පරිච්ඡේදයට අදාලව ඉඩම් රෙජිස්ටාර් ජනරාල්වරයාගෙන් රු. 2,089,440 ක මුද්දර ගාස්තු අයකර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 32 ක් හා තත්‍ය සේවක සංඛ්‍යාව 21 කි. ඒ අනුව සේවක පුරපාඩු 12 ක් හා සේවක අතිරික්ත 01 ක් විය.

3.2 ඌන උපයෝජිත වත්කම්

-----------------------------

සභාවේ ජල බවුසරය නිෂ්ක්‍රියව තිබුණි.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------

4.1 අයවැය පාලනය

-----------------

වියදම් ව්‍යුහය

---------------

අයවැයගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු. 3,200 සිට රු. 5,921,202 දක්වා වියදම් විචලනයක් විගණනයේදී නිරීක්ෂණය විය.